# සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සබරගමුව පළාත් සභාවේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් හා ඉංග්‍රීසි පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාධාරීන් (සිංහල/දෙමළ මාධ්‍යය) බඳවා ගැනීමේ තරඟ විභාගය - 2018

සබරගමුව පළාතේ පළාත් සභාවට අයත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් සහ 3-I(ඇ) ශ්‍රේණියට ඉංග්‍රීසි පිළිබඳ ද්වි අවුරුදු ඩිප්ලෝමාධාරීන් (සිංහල/දෙමළ මාධ්‍යය) පාසල් පාදකව බඳවා ගැනීම පිණිස සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන්/ ඉංග්‍රීසි පිළිබඳ ද්වි අවුරුදු ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01) යෝග්‍යතා :-

### අ. සාමාන්‍ය සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට එනම් 2018.07.20 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට එනම් 2018.07.20 දිනට පූර්වාසන්න, සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී තම ස්ථිර පදිංචිය ග්‍රාම සේවා සහතික හෝ අදාළ වෙනත් ලියවිලි මගින් සනාථ කළ යුතු වේ.)

v. මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

### ආ. අධ්‍යාපන සුදුසුකම් :

i. අයදුම් කරනු ලබන සියලුම උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2018.07.20 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම (දේශීය/විදේශීය) විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමෙන ආයතනයකින් උපාධියක් ලබා තිබිය යුතු අතර, ඉංග්‍රීසි පුරප්පාඩු සඳහා අයදුම් කරන ඩිප්ලෝමාධාරීන් 2018.07.20 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම (දේශීය/විදේශීය) විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ද්වි අවුරුදු ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. එම උපාධියට/ ඩිප්ලෝමාවට හඳුරා ඇති ප්‍රධාන විෂයයන් වලට අනුකූලව එක් එක් විෂය සඳහා උපලේඛන අංක I හි සඳහන් සුදුසුකම් සමග පහත ii හි සුදුසුකම සපුරා තිබීම අනිවාර්යය වේ.

ii. අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාගය පහත සඳහන් පරිදි සමත්ව තිබිය යුතුය.

- අ.පො.ස.(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව, සම්මාන 03ක් සහිතව විෂයන් 06 කින් සමත්වීම.
- අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් නව නිර්දේශය යටතේ එක්වරකදී විෂයයන් 03 (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

(**සටහන :** විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ටද අයදුම්කළ හැකිය).

### උපලේඛන අංක I

| විෂය කේත අංකය | පුරප්පාඩු විෂය | අධ්‍යාපන සුදුසුකම් | පළාත තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
| 1 | ප්‍රාථමික | පිළිගත් විශ්වවිද්‍යාලයකින් මව්බස (සිංහල/දෙමළ), ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම හෝ, | 68 | 42 |
| | | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපනවේදී උපාධියක් ලබා තිබීම හෝ, | | |
| | | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් ලබා තිබීම. | | |
| 2 | විද්‍යාව (සා.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 60 | 20 |
| 3 | ගණිතය (සා.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, ගණිතය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 87 | 23 |
| 4 | ඉංග්‍රීසි භාෂාව (සා.පෙළ) | උපාධිධාරියෙකු නම් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය/ඉංග්‍රීසි විෂය ඉගැන්වීම ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් ලබා තිබීම. (ඉංග්‍රීසි මාධ්‍යයෙන් වෙනත් උපාධියක් හදාරා තිබීම සුදුසුකමක් නොවේ). හෝ, | 60 | 25 |
| | | ඩිප්ලෝමාධාරියෙකු නම් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම සමග, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් පිරිනමනු ලබන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ද්වි අවුරුදු (පූර්ණ කාලීන/අර්ධ කාලීන) ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ, | | |
| | | ඩිප්ලෝමාධාරියෙකු නම් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම සමග, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම (දේශීය/විදේශීය) විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ද්වි අවුරුදු (පූර්ණ කාලීන/අර්ධ කාලීන) ඩිප්ලෝමාවක් ලබා තිබීම. | | |
| 5 | ගෘහ ආර්ථික විද්‍යාව (සා.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආහාර විද්‍යාව හා පෝෂණය, ආහාර විද්‍යාව හා තාක්ෂණය, ගෘහ ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් උපාධියක් ලබා තිබීම හෝ, | 14 | 5 |
| | | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමග අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ගෘහ ආර්ථික විද්‍යාව විෂය සඳහා අවම වශයෙන් අධි (B) සාමාර්ථයක් ලබා තිබීම. | | |
| 6 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තාක්ෂණවේදී උපාධියක් ලබා තිබීම හෝ භෞතික විද්‍යා විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 8 | 6 |
| 7 | ඉංජිනේරු තාක්ෂණවේදය (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් තාක්ෂණවේදී, යාන්ත්‍රික, ඉදිකිරීම්, විදුලිය හා ඉලෙක්ට්‍රොනික යන ක්ෂේත්‍රයන්ට අදාළව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 4 | 8 |
| 8 | ජෛව පද්ධති තාක්ෂණවේදය (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂි විද්‍යා විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 4 | 6 |
| 9 | රසායන විද්‍යාව/භෞතික විද්‍යාව/ජීව විද්‍යාව (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 25 | 22 |
| 10 | සංයුක්ත ගණිතය (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, ගණිතය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 6 | 6 |
| 11 | ගිණුම්කරණය (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් හෝ උසස් ජාතික ගිණුම්කරණ සිව් අවුරුදු ඩිප්ලෝමාවක් ලබා තිබීම. | 8 | 8 |
| 12 | ආර්ථික විද්‍යාව (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී උපාධියක් ලබා තිබීම. | 15 | 7 |
| 13 | සිංහල භාෂාව හා සාහිත්‍යය (සා.පෙළ)<br>සිංහල (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී උපාධියක් ලබා තිබීම. | 40 | - |
| 14 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (සා.පෙළ)<br>ව්‍යාපාර අධ්‍යයනය (උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් හෝ උසස් ජාතික වාණිජ/ කළමනාකරණ/ගිණුම්කරණ සිව් අවුරුදු ඩිප්ලෝමාවක් ලබා තිබීම. | 32 | 20 |

| | | | | |
|---|---|---|---|---|
| 15 | චිත්‍ර/චිත්‍ර කලාව (සා. පෙළ/උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් සෞන්දර්යය/ලලිතකලා විශේෂවේදී/සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම හෝ, | 66 | 30 |
| | | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී/සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම හෝ, | | |
| | | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමග අ.පො.ස.(උ/පෙළ) විභාගයේදී චිත්‍ර කලාව විෂය සඳහා අවම වශයෙන් අධි (B) සාමාර්ථයක් ලබා තිබීම හෝ, | | |
| | | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක් සමග රජයේ ආයතනයකින් ලබාගත් චිත්‍ර කලාව පිළිබඳ එක් අවුරුද්දකට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. | | |
| 16 | නාට්‍ය හා රංග කලාව (සා. පෙළ/උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 14 | 9 |
| 17 | ප්‍රංශ භාෂාව (සා.පෙළ/උ. පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 8 | 1 |
| 18 | ජර්මන් භාෂාව (සා. පෙළ/උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 4 | 1 |
| 19 | ජපන් භාෂාව (සා.පෙළ/උ. පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 10 | 2 |
| 20 | රුසියානු භාෂාව (සා. පෙළ/උ.පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 6 | 1 |
| 21 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (සා.පෙළ/උ. පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. | 28 | 15 |
| 22 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය (සා.පෙළ/උ. පෙළ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් විශේෂවේදී හෝ සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම. | 13 | 12 |
| 23 | උපදේශනය | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝවිද්‍යාව/සමාජවිද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපදේශනය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් උපාධියක් ලබා තිබීම. | 50 | 20 |

**සැලකිය යුතුයි :-** විෂය ශ්‍රේණි අංක 1,5,15 හා 23 හි සඳහන් විෂයයන් හැර සෙසු විෂයයන් සඳහා අයදුම් කරනු ලබන සෑම උපාධිධාරියෙකුම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1597/742/027 යටතේ 2017 අගෝස්තු මස 29 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි ඉගැන්වීමට අපේක්ෂිත විෂයය, උපාධියට හදාරනු ලැබූ මුළු විෂය සංධාරයෙන් 1/3 ක් සම්පූර්ණ කළ අයවළුන් පමණක් විය යුතුය.

## 02) බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි :-

2:1 උපලේඛන අංක I පරිදි සබරගමුව පළාත තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පමණක් මෙම බඳවා ගැනීම් සිදු කෙරෙන අතර **(කෙසේ වෙතත් පවතින ප්‍රතිපාදන මත බඳවා ගන්නා දිනට ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාවද සලකා බලනු ඇත)**, මෙම දැන්වීමට අදාලව 01.අ. හා 01.ආ. හි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන පරිදි විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා තරග විභාගයක් පවත්වනු ලැබේ. එම විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය මත සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට අයදුම්කරුවන් භාජනය කරනු ලැබේ. ඒ අනුව ඔවුන් ලබාගන්නා මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව පවතින ගුරු පුරප්පාඩු සඳහා පාසල් පාදකව පත්වීම් ලබාදීමට සුදුස්සන් තෝරාගනු ලැබේ.

2:2 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-** ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීමට සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වන ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමක් සිදුකරනු නොලැබේ.

2:3 **ප්‍රායෝගික පරීක්ෂණය :-** ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම සඳහා පවත්වනු ලැබේ. අයදුම්කරුවන් විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයට අදාලව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබාදෙනු ඇත.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | අරමුණ හා ප්‍රවිෂ්ට වීම. | 05 | 02 |
| 2. | පෞරුෂය හා හඬ පාලනය. | 05 | 02 |
| 3. | සන්නිවේදනයේ පැහැදිලි බව. | 05 | 02 |
| 4. | කාල කළමනාකරණය. | 05 | 02 |
| 5. | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 25 | 10 |

2:3:1 **අතිරේක ප්‍රායෝගික පරීක්ෂණය (ඉංග්‍රීසි විෂයය සඳහා) :-** ඉංග්‍රීසි විෂය සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන්ගේ ඉංග්‍රීසි විෂයය ඉගැන්වීමට උචිත කථනය, ශ්‍රවණය, කියවීම හා ලිවීම පිළිබඳ කුසලතාවය මැන බැලීම සඳහා ඉහත 2:3 හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණයට අතිරේකව ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී අයදුම්කරුවන් විසින් ඉංග්‍රීසි විෂයයට අදාලව දෙන ලද මාතෘකාවක් යටතේ විනාඩි 05කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, එහිදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබාදෙනු ඇත.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | වාචික ඉදිරිපත් කිරීම/විස්තර කිරීම. | 10 | 04 |
| 2. | ලිඛිත ඉදිරිපත් කිරීම. | 10 | 04 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 20 | 08 |

2:4 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති තමුන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතිකපත් සම්බන්ධව පසුව සලකා බලනු නොලැබේ.

2:5 මෙම නිවේදනයට අදාලව පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී දුෂ්කර ප්‍රදේශයන්හි ඇති පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී අදාළ පුරප්පාඩු ලේඛනය අයදුම්කරුවන්හට ප්‍රදර්ශනය කරනු ලැබේ.

2:6 පළාත් මට්ටමින් විෂයානුබද්ධව ලැබෙන සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අවස්ථාවකදී, තරග විභාගයකින් තොරව සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට අයදුම්කරුවන් භාජනය කර සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2:7 අදාළ දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සරිලන, සුදුසුකම් ලත් අයදුම්පත් ප්‍රමාණයක් එම දිස්ත්‍රික්කයෙන් ලැබී නොමැති වුවහොත් පමණක් යාබද දිස්ත්‍රික්කයේ (රත්නපුර/කෑගල්ල) සුදුසුකම් ලත් අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ඇත.

2:8 රජයේ/පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරීන් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියටත්, ඩිප්ලෝමාධාරීන් 3-I(ඇ) ශ්‍රේණියටත් පත් කරනු ලැබේ.

2:9 මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව වන අතර, මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය ජීඒ-1-2016 දරන වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව රු.27,740-300X6-380X7-445X2-රු.33,090/- ක් වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු. 32,200/- මාසික වැටුප මත ද, ඩිප්ලෝමාධාරීන් මෙම වැටුප් පරිමාණයේ 07 වන පියවර වන රු 29,540/- මාසික වැටුප මත ද පිහිටවනු ලැබේ. වැටුප් ගෙවීම් සිදුකරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ.

2:10 මෙම බඳවා ගැනීම් පාසල් පාදකව සිදුකෙරෙන බැවින් සෑම අයෙකුම මුල් පත්වීම ලබන පාසලේ හෝ එම පාසල අයත් අධ්‍යාපන කලාපයේ අවම වශයෙන් අඛණ්ඩව වසර 05ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, එම කාලසීමාව තුළදී ස්ථාන මාරු හිමිකම් නොලැබේ. තවද, සබරගමුව පළාත තුළ අනිවාර්යයෙන්ම අවම වශයෙන් වසර 10ක් සේවය කළ යුතුය. මෙම කාල සීමාව තුළ කුමන හෝ හේතුවක් මත ජාතික පාසල් හෝ අන්තර් පළාත් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ. එහෙත් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන් මත ඕනෑම අවස්ථාවක පළාත තුළ ඕනෑම පාසලකට ස්ථාන මාරු කිරීමේ බලය සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ. පත්වීම් ලබන සියලුම පත්වීම්ලාභීන් සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සමග මේ පිළිබඳව ගිවිසුමකට එළඹිය යුතුය.

2:11 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතු වේ. 2014.10.23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38

# ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ☐

**සබරගමුව පළාත් සභාවේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා**
**ශ්‍රී ලංකා ගුරු සේවයට උපාධිධාරීන් හා**
**ඉංග්‍රීසි පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාධාරීන්**
**(සිංහල/දෙමළ මාධ්‍යය) බඳවා ගැනීමේ තරඟ විභාගය - 2018.**

## Competitive Examination for Recruitment of Graduates/ Diploma (Two Year) Holders In English To Sri Lanka Teachers Service To Fill The Exsisting Vacancies Of The Schools In Sabaragamuwa Province - 2018

- විභාගයට පෙනී සිටින නගරය ☐ නගර අංකය ☐
  (රත්නපුර - 01, කෑගල්ල - 02)
- විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍යය ☐
  (සිංහල - 2, දෙමළ - 3) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
- ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය ☐ දිස්ත්‍රික් අංකය ☐
  (රත්නපුර - 01, කෑගල්ල - 02)
- ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ☐
- උපලේඛන අංක I සඳහන් සුදුසුකම් අනුව පත්වීම් ලැබීමට අයදුම් කරන විෂය කේත අංකය, විෂයය, මාධ්‍යය හා දිස්ත්‍රික්කය අදාළ කොටුව තුළ ලියන්න.

| අනු අංකය | විෂය කේත අංකය | විෂය | මාධ්‍යය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

1). 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් (උදා:- PERERA A.B.)

..................................................

1.2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම සිංහලෙන්/දෙමළෙන්

..................................................

1.3 මුලකුරු වලින් දක්වෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..................................................

..................................................

2). 2.1 වර්තමාන ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)..................................................

..................................................

2.2 වර්තමාන ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) (ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) ..................................................

..................................................

2.3 දුරකථන අංකය : ජංගම.............................. නිවස..............................

3). 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2018.07.20 දිනට වයස : අවු ☐☐ මාස ☐☐ දින ☐☐

3.4 ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ (ස්ත්‍රී - 1, පුරුෂ - 0 ) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.5 විවාහක/අවිවාහක බව : ☐ (අවිවාහක - 1, විවාහක - 2 ) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.6 ජන වර්ගය : ☐ (සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 3, බර්ගර් - 4, වෙනත් - 5) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4). අධ්‍යාපන සුදුසුකම් : (විභාග ප්‍රතිඵල ලේඛනවල සහතික කළ පිටපත් අමුණා එවීම අනිවාර්යය වේ.)

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|
| පළමු වර | |
| දෙවන වර | |

| | විෂයය | පළමුවර සාමාර්ථය | දෙවනවර සාමාර්ථය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|
| | |

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

4.3 උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :

අ. උපාධිය/ඉංග්‍රීසි පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ඩිප්ලෝමාව : ..................................................

ආ. නිකුත් කළ විශ්වවිද්‍යාලය/ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය : ..................................................

ඇ. උපාධිය/ ඩිප්ලෝමාව වලංගු දිනය : ..................................................

ඈ. උපාධියට/ ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් : ..................................................

(උපාධියට/ඩිප්ලෝමාවට අදාළ විස්තරාත්මක සහතිකයේ (Detail Certificate/Academic Transcript) සහතික කළ පිටපතක් අමුණා එවීම අනිවාර්යය වේ)

5). 5.1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) : ..................................................

5.2 කුවිතාන්සියේ අංකය : ..............................

5.3 නිකුත් කළ කාර්යාලය : .............................. 5.4 දිනය : ..............................

**කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.**

6). **අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය :** මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසම්පූර්ණ හෝ අසත්‍ය බව මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, පසුව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ බලය පවරනු ලබන වෙනත් ආයතනයක් විසින් පනවනු ලබන නීතිරීති වලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.............................. ..................................................
දිනය අයදුම්කරුගේ/කාරියගේ අත්සන

7). **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :** මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. ස්වාමීන් වහන්ස/මයා/මිය/මෙය මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී .............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

.............................. ..................................................
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

8). අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය : .............................. .............................. ස්වාමීන් වහන්ස/මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/ අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

**දිනය :..............................** ..................................................

**තනතුර :..............................** **දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියා**

**අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :..............................**

**(නිල මුද්‍රාව)**